# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (නාට්‍ය හා රංග කලාව) සතිඅන්ත
පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2016/2017

## අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම - II

**පැය 2 විනාඩි 15**

**ඕනෑම ප්‍රශ්න හයකට (06) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. i. අධ්‍යාපන මනෝවිද්‍යා විෂය අන්තර්ගතය ප්‍රධාන මාතෘකා ඔස්සේ සැකෙවින් දක්වන්න.

(ලකුණු 6)

ii. ඉහත (i) හි දැක්වූ මාතෘකා අතුරින් ඕනෑම 2 ක් නාට්‍ය හා රංග කලා ගුරුවරයාට ප්‍රයෝජනවත් වන ආකාරය උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 6)

2. i. නව යොවුන් විය සංවර්ධනයේ කැපී පෙනෙන සමාජ-චිත්තවේග ලක්ෂණ 2 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

ii. නාට්‍ය හා රංග කලාව විෂය ඉගෙනුම නව යොවුන් විය සංවර්ධන අවශ්‍යතා සපුරා ගැනීමට ඉවහල් කර ගත හැකි ආකාරය නිදසුන් 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

3. i. ජින් පියාජේ ඉදිරිපත් කළ ප්‍රජානන සංවර්ධන අවධි නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

ii. පියාජේගේ න්‍යායට අනුව වියුක්ත චින්තන අවධියේ ළමයින්ගේ බුද්ධිමය ලක්ෂණ දක්වා එම අවධියේ ළමයින් සඳහා නාට්‍ය හා රංග කලා ගුරුවරයකු ලෙස ඉගෙනුම් අවස්ථා සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 7)

4. i. පෞරුෂය යන්න නිර්වචනය කර, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ න්‍යායට අනුව පෞරුෂ සංවර්ධනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 6)

ii. සිසු පෞරුෂය සංවර්ධනය සඳහා වෘත්තිය ගුරුවරයකු ලෙස ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රියාවලිය දායක කරගන්නා ආකාරය උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 6)

5. i. ඉගෙනුම් චර්යාවන් කෙරෙහි උපස්ථම්භනය බලපෑ හැකි ආකාර න්‍යායාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 6)

ii. නාට්‍ය හා රංග කලාව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී උපස්ථම්භන භාවිතය උදාහරණ 2 ක් ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 6)

6. i. සංකල්පය සාධනය පැහැදිලි කරන්න. (ලකුණු 6)

ii. සංකල්ප නිවැරදිව සාධනය වන ආකාරයට ඉගැන්වීම සඳහා ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

7. i. විශේෂ අවශ්‍යතා සහිත ළමුන් වර්ගීකරණය කර, සුහග ළමයකුගේ ලක්ෂණ ලයිස්තු ගත කරන්න.

(ලකුණු 6)

iii. විශේෂ අවශතා සහිත ළමුන් පිළිබඳ අවබෝධය නාට්‍ය හා රංග කලා ගුරුවරයාට වැදගත් වන ආකරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

8. i. අවධානය හා සංජානනය හඳුන්වන්න.

(ලකුණු 6)

ii. අවධානය හා සංජානනය ඉගෙනීමට දායක වන ආකාරය උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

(ලකුණු 6)

○∘○∘○∘○∘○∘○∘○∘